{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாண கல்வித்திணைக்களம் - வடமத்திய மாகாணம்
**Department of Education – North Central Province**

| 09 - ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2024 | කාලය : පිළිතුරු පත්‍රය |
|---|---|---|

විෂයය :- නාට්‍ය හා රංග කලාව
පාසලේ නම :- ..............................
ඇතුළත්වීමේ අංකය :- ..............................

## පිළිතුරු පත්‍රය

### I කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|
| 1 | 2 | 11 | 2 |
| 2 | 3 | 12 | 4 |
| 3 | 1 | 13 | 3 |
| 4 | 4 | 14 | 1 |
| 5 | 2 | 15 | 2 |
| 6 | 3 | 16 | 3 |
| 7 | 1 | 17 | 2 |
| 8 | 4 | 18 | 4 |
| 9 | 2 | 19 | 3 |
| 10 | 3 | 20 | 1 |

ලකුණු 2 x 20 = 40

### II කොටස

01. (1) සේරිවාණිජ ජාතකය

(2) අතීත වක්තෘ

(3) සේරිවාණිජ

(4) ලලිතා සරච්චන්ද්‍ර මහත්මිය

(5) දේවදත්ත ලෙසට

(6) හත මිවිය දිගේ / අතිරේක වේදිකාව (ලකුණු 2 x 6 = 12)

02. (1) ගැටුම (ලකුණු 02)

(2) චරිතයක් චරිතයක් අතර

චරිතයක් සත්ත්ව චරිතයක් අතර

චරිතයක් අදෘශ්‍යමාන බලවේග අතර

චරිතයක් තම මනස සමඟ

චරිතයක් සමාජ පරිසරය සමඟ (ලකුණු 4)

(3) නැරඹූ වේදිකා නාට්‍යයක් ඇසුරින් කරුණු 03ක් වත් විස්තර කර තිබීම (ලකුණු 6)

03. (1) රංග අභ්‍යාස

රංග ක්‍රීඩා (ලකුණු 02)

(2) රංග අභ්‍යාස - ශිථිලකරණ අභ්‍යාස
කටහඬ අභ්‍යාස
දර්පණ අභ්‍යාස
සංවේදන අභ්‍යාස
තාපන ව්‍යායාම
ශ්වසන අභ්‍යාස
මානසික ඒකාග්‍රතාවය ඇතිකර අභ්‍යාස

(2) රංග ක්‍රීඩා - මීමෝ මීමෝ
අංක ක්‍රීඩාව
වල්ගය කැඩීම
රාක්ෂයෙක් ගමට ඇවිත්
නායකයා සෙවීම
පෙරළුණු ඔරුව හරවමු
හොරා පොලිස්
මෝරා සහ දූපත ආදී ලෙස (ලකුණු 4)

(3) රංග අභ්‍යාස තුලින්,
ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව
ශරීරය නම්‍යශීලි වීම.
මානසික ඒකාග්‍රතාවය ඇති වීම.
ධාරණ ශක්තිය ඇති වීම
පරිකල්පන හැකියාව වර්ධනය වීම.
නිවැරදි වචන උච්චාරණයට හුරු වීම.
නිර්මාණශීලි හැකියාව. ආදී කරුණු සලකා බලා (කරුණු 6ක් නම් ලකුණු 6)

04. (1) a. ලෝක ධර්මී නාට්‍ය සම්ප්‍රදාය
b. නාට්‍යධර්මී නාට්‍ය සම්ප්‍රදාය (ලකුණු 2)

(2) ලෝකධර්මී සම්ප්‍රදාය යනු ලෝකයේ ස්වභාවයට බෙහෙවින් සමීප වන පරිදි නාට්‍ය රඟ දැක්වීම වේ.

නාට්‍ය ධර්මී සම්ප්‍රදාය යනු ලෝක ස්වභාවයට අනුගත නොවන අයුරින් අතිශයෝක්තියෙන් යුක්තව නාට්‍ය රඟදැක්වීම වේ. (ලකුණු 4)

(3)

| ලෝක ධර්මී | නාට්‍ය ධර්මී |
|---|---|
| • ලෝක ස්වභාවයට සමීප වීම.<br>• සාමාන්‍ය ව්‍යවහාරයේ පවතින ආකාරයට සංවාද භාවිතය.<br>• සාමාන්‍ය පරිදි වේදිකාවේ හැසිරීම.<br>• නාට්‍යයට ගැලපෙන පරිදි පසුතල නිර්මාණ භාවිතා කිරීම.<br>• නාට්‍ය සංගීතය අවශ්‍ය නම් පමණක් යොදා ගැනීම.<br>• අංග රචනය සාමාන්‍ය පරිදි සිදු කිරීම.<br>• වේෂ භූෂණ සාමාන්‍ය පරිදි යොදා ගෙන තිබීම. | • ලෝක ස්වභාවයට අනුගත නොවීම.<br>• තාලානුකූල සංවාද භාවිතය.<br>• බෙර පද තාලයට අනුව එක් එක් චරිත වේදිකාවට පැමිණීම.<br>• පසුතල භාවිතය අවම වන අතර අවශ්‍ය රංග භාණ්ඩ පමණක් යොදා ගැනීම.<br>• නාට්‍ය සංගීතය අත්‍යවශ්‍ය වීම.<br>• සෑම චරිතයකට සුවිශේෂී වූ අංග රචනයක් යොදා ගැනීම.<br>• ඉතා අලංකාර ලෙස විශේෂිත වූ වේෂ භූෂණ යොදා ගැනීම. |

(ලකුණු 6)

05. (i) තමාගේ පෞද්ගලිකත්වයෙන් මිදී වෙනත් චරිතයකට ප්‍රවේශ වීම සමාරෝපය නම් වේ.

(ලකුණු 2)

(ii) අභ්‍යන්තර සමාරෝපය යනු, චරිතයේ හැඟීම් වටහා ගැනීමට චරිතයට අවශ්‍ය පරිදි කඩහඬ , ශරීරාංග හසුරුවා ගැනීමට අභ්‍යන්තරව ප්‍රවේශ වීමයි.

බාහිර සමාරෝපය යනු වේෂභූෂණ , අංගරචනය හා නාට්‍යෝපකරණ මඟින් රූපණයේ යෙදීමයි.

(ලකුණු 4)

(iii)

- නාට්‍ය පිටපත අධ්‍යයනය කිරීම.
- අධ්‍යක්ෂවරයා සමඟ සාකච්ඡා කිරීම.
- චරිත ස්වභාවය අධ්‍යයනය කිරීම.
- රංගනයේ යෙදෙන අනෙකුත් චරිත පිළිබඳ අවධානය යොමු කිරීම.
- චරිතයේ වයස, බාහිර පෙනුම සලකා බැලීම.
- නාට්‍යයේ ස්වභාවය අධ්‍යයනය කිරීම. (ලෝකධර්මී, නාට්‍ය ධර්මී)
- කාලය, දේශය , යුගය පිළිබඳ සොයා බැලීම.
- අනුකරණය හා සතර අභිනය පිළිබඳ අවබෝධය ආදි ලෙස විස්තර කිරීම.

(ලකුණු 06)

06. (i) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා (ලකුණු 02)

(ii) (i) වෙනත් භාෂා වලින් ලියවුණු නාට්‍ය

(ii) ජාතක කතා ඇසුරින් නිෂ්පාදනය කළ නාට්‍ය

(iii) පුරාවෘත්ත හා වෙනත් කතා ආශ්‍රයෙන් නිෂ්පාදිත නාට්‍ය

(iv) ස්වතන්ත්‍ර නාට්‍ය (ලකුණු 04)

(iii)

- 1940 දශකය වන විට විද්‍යාලය තුළ සිංහල නාට්‍ය නිෂ්පාදනය කිරීම.
- සිංහල සාම්ප්‍රදායික ගැමි කලාව ආශ්‍රය කර ගනිමින් සිංහල නාට්‍යයේ නව ආකෘතියක් ගොඩනැගීමට පර්යේෂණ සිදු කිරීම.
- පුරාණෝයොක්ති , ජනකතා, ජාතක කතා මෙන්ම වර්තමාන සමාජ සංසිද්ධි ද භාවිතා කරමින් ප්‍රශස්ත ගණයේ නාට්‍ය රාශියක් බිහි කිරීම.
- සෑම නිර්මාණයක් ම නව දෘෂ්ටියක් හා අපූර්වත්ය කුළු ගැන්වෙන අයුරින් ඉදිරිපත් කිරීමට දක්ෂ පුද්ගලයෙකු වීම.
- '' සිංහල ගැමි නාටකය '' වැනි විශිෂ්ට ග්‍රන්ථ නාට්‍යකලාව වෙනුවෙන් රචනා කළ නාට්‍ය කරුවෙකු වීම.
- 1956 මනමේ නාට්‍ය ප්‍රදර්ශනය කිරීමෙන් දේශීය නාට්‍ය කලාවේ ආරම්භය සනිටුහන් කිරීම.
- මනමේ, සිංහබාහු , මහාසාර වැනි නාට්‍යධර්මී නාට්‍යයන්ද බහින කලාව , වඳින්න ගිය දේවාලය ආදී ස්වතන්ත්‍ර නිර්මාණ , නාට්‍ය කලාවට දායාද කිරීම ආදී කරුණු සලකා බලා (ලකුණු 06)

07. තේමාවට උචිත පරිදි නාට්‍ය පිටපත ලියා තිබීම

(ලකුණු 12)